# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1467/22 – 2006 ඔක්තෝබර් 19 වැනි බ්‍රහස්පතින්දා – 2006.10.19

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### බස්නාහිර පළාත් සභාව

### 1990 අංක 06 දරන මුදල් ප්‍රඥප්තිය

### 7 (1) වැනි වගන්තිය යටතේ නියෝගය

බස්නාහිර පළාතේ, පළාත් සභාවේ, 1990 අංක 06 දරන මුදල් ප්‍රඥප්තියේ 7 (1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලතල ප්‍රකාර, බස්නාහිර පළාතේ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය සහ මුදල්, ක්‍රමසම්පාදන, නීතිය හා සාමය, පළාත් පාලන, පළාත් පරිපාලන, අධ්‍යාපන ප්‍රවාහන, රැකීරක්ෂා, සංස්කෘතික හා කලා කටයුතු පිළිබඳ අමාත්‍ය, පේස්තේරුවේ ලියනරාළලාගේ රෙජිනෝල්ඩ් රොස්මන්ඩ් කුරේ විජේවර්ණසූරිය වන මම, එකී වගන්තිය යටතේ සාදා 1990.11.20 වැනි දින සහ අංක 637/8 දරන අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළකරන ලද්දා වූ ද, එකී වගන්තිය යටතේ සාදා 1996.04.19 දින සහ අංක 919/21 දරන *අති විශෙෂ* ගැසට් පත්‍රයෙහි පළ කරන ලද නියෝගයෙන් අවසන් වරට සංශෝධනය කරනු ලැබූවාවූ ද, නියෝගය 2006.10.31 මධ්‍යම රාත්‍රියෙහි/2006.11.01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි පහත දැක්වෙන ලෙස සංශෝධනය කරමි.

(1) (එ) උප ඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත සඳහන් උප ඡේදය ආදේශ කිරීමෙන්,

(එ) අරක්කු (පදම් කළ අරක්කු, කලවම් අරක්කු ඇතුළුව), බීර, වයින්, රා සහ වෙනත් ආනයනික හෝ මෙරට නිෂ්පාදිත මත්පැන් වර්ග මිළට ගෙන විකිණීමේ ව්‍යාපාර සම්බන්ධයෙන් — සියයට 02

(2) (එ) උප ඡේදයට ඉක්බිතිවම පහත සඳහන් උප ඡේදයන් එකතු කිරීමෙන්,

(ඒ) සිගරට් මිළට ගෙන විකිණීමේ ව්‍යාපාරයේ පිරිවැටුම සම්බන්ධයෙන් — සියයට 02

(ඔ) ඉහත (අ), (ආ), (ඉ), (ඊ), (උ), (ඌ), (එ) සහ (ඒ) යටතේ සඳහන් යම් ව්‍යාපාරයක් හැර යම් ද්‍රව්‍යයක් හෝ භාණ්ඩයක් මිළට ගෙන විකිණීමේ ව්‍යාපාරයේ පිරිවැටුම සම්බන්ධයෙන් — සියයට 01

පේස්තේරුවේ ලියනරාළලාගේ රෙජිනෝල්ඩ් රොස්මන්ඩ් කුරේ විජේවර්ණසූරිය,
බස්නාහිර පළාතේ, පළාත් සභාවේ, ප්‍රධාන අමාත්‍ය සහ මුදල් ක්‍රමසම්පාදන, නීතිය හා සාමය,
පළාත් පාලන, පළාත් පරිපාලන,අධ්‍යාපන ප්‍රවාහන, රැකීරක්ෂා, සංස්කෘතික හා
කලා කටයුතු පිළිබඳ අමාත්‍ය.

..06 ඔක්තෝබර් මස 19 වැනි දින,
..ස්නාහිර පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය කාර්යාලය,
..වස්ති මන්දිරය, කොළඹ 07.

.. - 129.


..PG 000630 - 1500 (2006/10)
ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන